# Abstract 18

## ශ්‍රම සූරාකෑම පිළිබඳ බෞද්ධ ආකල්පය

**පී. ජී. ඩී. ප්‍රියදර්ශනී,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රථම වසර - බෞද්ධ සංස්කෘතිය),
*dinushapriyadarshani94@gmail.com*

ආර්ථික රටාව තුළ ශ්‍රම දායකයන්ට වැදගත් ස්ථානයක් හිමි වේ. ශ්‍රමදායකයන් නොමැතිව ආර්ථිකයේ පැවැත්මක් නොමැත. නිරන්තර නිෂ්පාදන, බෙදාහැරීම් ආදි කාර්යයන්හි නිරත වෙමින් සේව්‍යයන් සඳහා ඔවුහු තම ශ්‍රමය ප්‍රදානය කරති. එහෙත් ගැටලුව වන්නේ එම ශ්‍රම දායකත්වයට නිසි ඇගයීම් සිදු නො වීම යි. එහෙයින් ම සේව්‍යයාගේ සාර්ථකත්වයත් සේවකයාගේ අපේක්ෂා භංගත්වයත් සමාජය තුළ ස්ථාවර වෙමින් පවතී. මෙම සමාජ ගැටලුව සම්බන්ධයෙන් **සිඟාලෝවාද සූත්‍රය** ප්‍රමුඛ බෞද්ධ මූලාශ්‍රය දක්වන කරුණු පිළිබඳව විශ්ලේෂණයක යෙදීම මෙයින් අපේක්ෂිත ය. වඩාත් අර්ථවත් වූ සමාජ රටාවක් බිහි කිරිමට මෙමගින් කටයුතු කිරිමට උත්සාහ කිරීම වැදගත් ය. ශ්‍රම දායක ඉතිහාසය විමසන විට වහල් වෙළදාම එහි මූලිකත්වය ගනු ලැබී ය. එහි දී සිදුවූයේ ශ්‍රම සූරා කෑමකි. ක්‍රමයෙන් කාර්මික විප්ලවය ද සමග උදා වූ වාණිජ ආර්ථිකය යටතේ කර්මාන්ත තුළ ශ්‍රම දායකයන් බිහි වුව ද ශ්‍රමය සම්බන්ධ පිළිවෙතෙහි වෙනසක් නො වීය. ශ්‍රමයට සරිලන වටිනාකමක් ලබා නො දීම නිසාවෙන් පවුල් සංස්ථා බිඳ වැටීම්, දුගී බවට පත්වීම්, මානසික පීඩා, දූෂිත ක්‍රියාවලට යොමු වීම් ආදි බොහෝ සමාජ ව්‍යසන සිදු වී තිබේ. **සිඟාලෝවාද සූත්‍රය, විමානවත්ථු හා පේතවත්ථු** වැනි බෞද්ධ මූලාශ්‍රයවල මේ සම්බන්ධයෙන් මතු කළ හැකි බෞද්ධ විග්‍රහය පිළිබිඹු වේ. එබැවින් එම කරුණු විශ්ලේෂණාත්මක අධ්‍යයනයකට යොමු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

**ප්‍රමුඛ පද :** ආර්ථිකය, වාණිජකරණය, සිඟාලෝවාද සූත්‍රය, ශ්‍රමය, ශ්‍රම සූරාකෑම